පොලිස්පති ගෙන්,

සියලුම : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
නියෝජ්‍ය පොලිස්පති,
කොට්ඨාසභාර නිලධාරීන්,
අධ්‍යක්ෂවරුන්,
අණදෙන නිලධාරී ක්ෂේත්‍ර බලකා මූලස්ථානය,
දිස්ත්‍රික් භාර නිලධාරීන්,
මූ.පො.ප/ ස්ථානාධිපති
( ක්‍රියාකාරී/ ප්‍රාදේශීය කොට්ඨාස)

සහකාර පොලිස් අධිකාරී ( පිරිමි ) තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2020
( සහායක සේවා සහ විශේෂ කාර්ය බලකාය හැර )
**අයදුම්පත් කැඳවීමේ නිවේදනය**

ශ්‍රී ලංකා පොලිසියේ, සහකාර පොලිස් අධිකාරී ( පිරිමි ) තනතුරෙහි පවත්නා පුරප්පාඩු 46 ක් පිරවීම සඳහා මෙහි අනු අංක 02 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2021.08. 24 දිනැති මහජන ආරක්ෂක ලේකම්ගේ අංක 02/05/72/01/2021 දරණ ලිපියෙහි නියමයන් පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (විභාග), දෙවන මහල, අංක 07, කොටා ටෙරස් ආචාර්ය ඇන්.එම්.පෙරේරා මාවත, කොළඹ 08 යන ලිපිනයට පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ ආවරණ ලිපියක් සහිතව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් හෝ භාර දිය හැකිය.
ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සහකාර පොලිස් අධිකාරී ( පිරිමි ) තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2020 තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුයි.

(අ) අයදුම්පත් භාර ගනු ලබන අවසාන දිනය 2021.09.19 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව ඒ ඒ අපේක්ෂකයා වෙත පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ. අසම්පූර්ණ හෝ සුදුසුකම් නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්කරුවන් වෙත ලැබීමට සලස්වනු ඇත. මෙම සීමිත තරග විභාගය 2021 නොවැම්බර් මාසය තුළ කොළඹදී පැවැත්වෙනු ඇත.

**1. වැටුප් පරිමාණය;**

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615-10 x 1,335- 8 x 1,630 – 17 x 2,170- 110,895/- (SL-1-2016) වේ.

**2 සුදුසුකම්**

**2.1 අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නොවේ.**
**2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.**
**2.3 පලපුරුද්ද**

I. ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරියකු වීම;
හෝ
II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් හිමි පොලිස් පරීක්ෂක නිලධාරියකු වීම;
හෝ
III. අවම වශයෙන් පරීක්ෂක ශ්‍රේණියේ වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද පොලිස් පරීක්ෂක තනතුරේ පත්වීම ස්ථිර කරන ලද පොලිස් පරීක්ෂක නිලධාරියකු වීම;
හෝ

IV. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් උපාධියක් හිමි, සේවය/ පත්වීම ස්ථිර කරන ලද, සේවා කාලය වසර 05 ක් සම්පූර්ණ කරන ලද උප පොලිස් පරීක්ෂක නිලධාරියකු වීම

හා

V. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පූර්වාසන්නම අවුරුදු 03 තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම.

**2.4 වෙනත්**

i. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

**3. වයස් සීමාව :-** අදාළ නොවේ.

**4. බඳවා ගැනීමේ ක්‍රමය :-**

ලිඛිත විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනු ලැබේ. පළමුව ලිඛිත විභාගය පවත්වනු ලැබේ. ලිඛිත විභාගයේදී සියලුම විෂයන් සමත් ( එක් එක් විෂයට 40% ට වඩා වැඩි ලකුණු ලබා ගෙන ඇති) අයදුම්කරුවන් අතුරින් ඉහළ ලකුණු ලබා ඇති අයදුම්කරුවන් බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් (05) ගුණයක අයදුම්කරුවන් සංඛ්‍යාවක් ලිඛිත විභාග අංක අනුපිළිවෙළ අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එසේ කැඳවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් ලබා දෙනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සහ ලිඛිත විභාගයේදී ලබා ගන්නා ලද ලකුණුවල එකතුව මත කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පිරිමි පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.( පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ)

**5. පත්වීමේ හා සේවා කොන්දේසි;**

I. මෙම පත්වීම වසර 02 ක වැඩ බැලීමේ කාලයකට යටත්ය. මෙම තනතුරට බඳවා ගෙන වසර 02 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

II. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ / රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, ශ්‍රී ලංකා පොලිසියෙහි අත්පොත්වල හා උපදෙස් සංග්‍රහවල විධි විධානවලට ද යටත් විය යුතුය.

**6. 6.1 ලිඛිත විභාගය ;**

6.1.1. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් තෝරා ගනු ලබන විභාග මධ්‍යස්ථානයකදී හෝ මධ්‍යස්ථාන කිහිපයකදී පවත්වනු ඇත. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වෙන අතර, අපේක්ෂකයකු කැමති භාෂා මාධ්‍යයකින් ඊට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනෙන් පසු මෙම භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**6.1.2. විෂය නිර්දේශය.**

| අංකය | විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | කාලය පැය |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 100 | 40 | 01 |
| 02 | සාමාන්‍ය දැනීම | 100 | 40 | 01 |
| 03 | භාෂා ප්‍රවීණතාව | 100 | 40 | 02 |
| 04 | නීතිය | 100 | 40 | 02 |
| 05 | ප්‍රායෝගික පොලිස් විධි | 100 | 40 | 02 |